බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020
උපකාරක ප්‍රශ්න පත්‍රය

| ශ්‍රේණිය 11 | විෂයය : ඉතිහාසය | පත්‍රය: I | කාලය: පැය 01 යි |
|---|---|---|---|

## I පත්‍රය

සැලකිය යුතුය.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

(01) පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රයක් වන දීපවංසයේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) දීර්ඝව විස්තර සඳහන් වීම.
(2) අඛණ්ඩ ඉතිහාසය ලියා තිබීම.
(3) පුනරුක්ති දෝෂ පැවතීම.
(4) දේශපාලන තොරතුරු පමණක් සඳහන් වීම.

(02) මෙරට පැරණි ම ශිලා ලේඛන හඳුන්වනු ලබන්නේ,
(1) ටැම් ලිපි නමිනි. (2) බ්‍රාහ්මීය ලිපි නමිනි.
(3) පුවරු ලිපි නමිනි. (4) පර්වත ලිපි නමිනි.

(03) උසස් තාක්ෂණික නිර්මාණයකින් යුතු මැටි බඳුන් පිළිබඳ තොරතුරු ලැබී ඇති ප්‍රදේශය වන්නේ,
(1) උඩ රංචාමඩම ය. (2) පාහියන් ලෙන ය.
(3) ඉබ්බන්කටුව ය. (4) මාතියම්ගම ලෙන ය.

(04) විනාශකාරී ගංවතුර පාලනය කිරීමේ තාක්ෂණය නොදත් මුල් ඓතිහාසික යුගයේ ජනතාව තම ජනාවාස පිහිටුවා ගත්තේ,
(1) කඳුකර ප්‍රදේශවලය. (2) කඳු බෑවුම් වලය.
(3) ගංගා නිම්න ආසන්නයේ ය. (4) ගංගා නිම්න වලට පිටතිනි.

(05) පූර්ව රාජ්‍ය සමයේ පරුමකයෙකු බිහිවීමේ අවශ්‍යතාවය ගොඩනැගෙන්නේ,
(1) වැව නඩත්තු කිරීමට ය. (2) වැඩිවන ජනගහනය පාලනය සඳහා ය.
(3) රජුගේ පාලන කටයුතු වලට සහය වීමට ය. (4) වැව් පද්ධතිය නඩත්තු කිරීමට ය.

(06) කාලිංග චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ නමින් සෙල්ලිපි වල තමන් හඳුන්වාගෙන ඇත්තේ,
(1) දුටුගැමුණු රජු ය. (2) නිශ්ශංකමල්ල රජු ය.
(3) කූටකණ්ණ තිස්ස රජු ය. (4) මහා පරාක්‍රමබාහු රජු ය.

(07) පළමුවන විජයබාහු රජතුමා පිළිබඳව සඳහන් වන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) පාණ්ඩ්‍ය දේශයේ කුමාරිකාවක් සමාන විවාහ විය.
(2) චෝල බලය විනාශ කිරීමට සමත්විය.
(3) මහා තිත්ථ වරාය සක්‍රීය කිරීමට දායක විය.
(4) අනුරාධපුර රාජධානියේ ප්‍රබල පාලකයෙකු විය.

(08) අන්තර්ජාතික වෙළඳාමේදී අපේ රට වැදගත් වීමට බලපෑ ප්‍රධානම හේතුවක් වූයේ,

(1) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීමය.
(2) මෝසම් සුලං වල බලපෑම ලැබීමය.
(3) විදේශ රටවල් සමඟ තිබූ ප්‍රබල රාජ්‍යතාන්ත්‍රික සබඳතාවය
(4) ත්‍රිකුණාමල වරායේ වැදගත්කමය.

(09)
- රාජසභාවේ 'දෙමළ අධිකාරී' නම් තනතුරක් තිබීම.
- දළදා මාලිගාවේ ආරක්ෂාව වේලෙයික්කාර හමුදාවට බාරදීම.
- සුලෙයිමාන් නැමති දේශගවේශකයා කිසිදු බාධාවකින් තොරව ශ්‍රී පාදය වන්දනා කිරීම.

ඉහත තොරතුරු වලින් පැහැදිලි වන්නේ,

(1) මුස්ලිම්වරුද අපේ රටේ සිටි බව ය.
(2) අතීත සමාජය වාර්ගික සහජීවනයෙන් කටයුතු කළ බවය.
(3) දෙමළ ජනතාවට රාජ්‍ය පාලන බලය තිබූ බවය.
(4) ශ්‍රී පාදය වන්දනා කිරීම අතීතයේ සිට පැවති බවය.

(10) සීගිරියේ ජල කාණු පද්ධතියේ රොන්මඩ ඉවත් කිරීම සඳහා යොදා ඇති ක්‍රමවේදය වූයේ,

(1) ඉවත් කළ හැකි ගල් පතුරු කාණුවලට යෙදීම.
(2) කාණු දඟරාකාරව සකස්කර තිබීම.
(3) වැඩි බෑවුමකින් යුතුව කාණු සකස් කර තිබීම.
(4) පළලින් වැඩි කාණු පද්ධතියක් සකස් කිරීම.

- පහත තොරතුරු ඇසුරෙන් 11 හා 12 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - ජලය පිටත ගැනීමේ දී සිදුවන පීඩනය පාලනය කිරීම.
B - ගංගාවක ජලය වෙනත් දිශාවකට හැරවීම.
C - රැස් කරගත් ජලය වෙනත් ප්‍රදේශයකට ගෙන යාම
D - භූමියේ බෑස්ම උපයෝගී කරගනිමින් නිර්මාණය කර තිබීම.
E - අතිරික්ත ජලය පිටව යාමට ක්‍රම යොදා තිබීම.

(11) වැව් බැම්ම ආරක්ෂා කිරීම සඳහා වාරි ශිල්පීන් අනුගමනය කර ඇති ක්‍රමවේද දක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා B ය. (2) C හා D ය. (3) A හා E ය. (4) D හා E ය.

(12) ඇළ මාර්ග හා සම්බන්ධ තොරතුරු දක්වෙන පිළිතුර කුමක් ද?

(1) C හා E ය. (2) A හා D ය. (3) B හා E ය. (4) C හා D ය.

(13) දෙවන රාජසිංහ රජු ලන්දේසීන් සමඟ සබඳතා ඇති කර ගැනීමට අවශ්‍ය වූයේ,

(1) වෙළෙඳාමට සම්බන්ධ කර ගැනීමට ය.
(2) යුධ කටයුතුවලට සහය කර ගැනීම සඳහා ය.
(3) නාවික සහය ලබා ගැනීම සඳහා ය.
(4) රදළ ප්‍රධානීන්ගේ තර්ජනවලට මුහුණ දීම සඳහා ය.

- පහත වගුවේ A සිට I දක්වා තොරතුරු ඇසුරෙන් 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ගය | ලංකාවේ රජු | පෘතුගීසි නායකයා |
|---|---|---|
| A 1638 | D පළමුවන විමලධර්මසූරිය රජු | G ජොරනිමෝද අසවේදු |
| B 1602 | E පළමුවන රාජසිංහ රජු | H දියෝගුද මේලෝ |
| C 1562 | F දෙවන රාජසිංහ රජු | I පෙරෙයිරාද ලසර්දා |

(14) බලන සටන හා සම්බන්ධ තොරතුරු සඳහන් පිළිතුර කුමක් ද?
(1) A,E හා H ය. (2) B,F හා G ය. (3) C,D හා H ය. (4) B,D හා G ය.

(15) ගන්නෝරුව සටන හා සම්බන්ධ තොරතුරු සඳහන් පිළිතුර කුමක් ද?
(1) A,E හා G ය. (2) C,E හා I ය. (3) A,E හා H ය. (4) B,E හා H ය.

(16) අතීත සමාජයේ කාන්තාවන්ට ගෞරවනීය පිළිගැනීමක් පැවති බවට තොරතුරු සඳහන් මූලාශ්‍ර කිහිපයක් 'අ' තීරුවේ ද ඒ හා සම්බන්ධ කාන්තා නම් 'ආ' තීරුවේ ද දක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. ලාහුගල නිල්ගිරි සෑය | A පරුමකලු සමනා |
| 2. බ්‍රාහ්මණයාගම සෙල්ලිපිය | B ලීලාවතී රැජින |
| 3. කොක් ඇබේ සෙල්ලිපිය | C තලතා ලක්ෂ්මී |
| 4. සද්ධර්මාලංකාරය | D අශෝක මාලා |
| | E චූල සීවලී දේවී |

(1) EDCB (2) EACD (3) ACDE (4) DECB

- පහත දක්වෙන ඓතිහාසික තොරතුරු ඇසුරෙන් 17 සහ 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - බෙලිගල දළදා මැදුරක් ඉදි කිරීම.
B - කෝට්ටේ බලකොටුව ඉදි කිරීම.
C - චන්ද්‍රභානු ජාවකගේ ආක්‍රමණය සිදු වීම.
D - ප්‍රභු පවුල් බලවත් වීම.
E - දළදා පූජාවලිය රචනා වීම.

(17) දඹදෙණි රාජධානි සමය පිළිබඳ තොරතුරු දක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා C ය. (2) B හා C ය. (3) D හා E ය. (4) C හා D ය.

(18) ගම්පොළ රාජධානි සමය පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා D ය. (2) B හා D ය. (3) B හා C ය. (4) D හා E ය.

(19) පළමුවෙනි විමලධර්ම සූරිය රජු පිළිබඳව නොගැළපෙන පිළිතුර තෝරන්න.
(1) දළදා වහන්සේ මහනුවරට වැඩම කරවීම.
(2) ගන්නෝරුව සටනේදී පෘතුගීසින් අන්ත පරාජයට පත් කිරීම.
(3) යකඩ කර්මාන්තය දියුණු කිරීම.
(4) බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම.

(20) උඩරට බද්දේ සංවිධානයේ 'හැඳ බද්ද' නම් කාර්යාංශයේ කාර්ය වූයේ,

(1) ප්‍රවාහන කටයුතු සිදු කිරීමයි. (2) ඇතුන් ඇල්ලීමයි.

(3) රෙදි විවීමයි. (4) කර්මාන්ත සිදු කිරීමයි.

(21) මහනුවර රාජධානියේ පැවති ඉඩම් භුක්තියට අනුව නින්දගම් නමින් හැඳින්වෙන්නේ,

(1) රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් කළ ඉඩම් ය.

(2) විහාර හා දේවාල සඳහා පූජාකළ ඉඩම් ය.

(3) දළදා මාලිගාවේ නඩත්තුව සඳහා වෙන් කළ ඉඩම් ය.

(4) රදළ ප්‍රධානීන්ට සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් ය.

(22) පහත ප්‍රකාශ අතුරෙන් තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරයා හා සම්බන්ධ ප්‍රකාශ දක්වෙන පිළිතුර කුමක් ද?

A - 1803 උඩරට ආක්‍රමණය කිරීම.

B - ජෝන් ඩොයිලිගේ සේවය ලබා ගැනීම.

C - මෙරටට පැමිණි දෙවන ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වීම.

D - 1815 උඩරට ගිවිසුම අත්සන් කිරීම.

(1) C හා D ය. (2) A හා D ය. (3) B හා C ය. (4) A හා B ය.

(23) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසු ගම්සභාව අඩපන වීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ,

(1) අධිකරණ පද්ධතියක් ආරම්භ වීමයි.

(2) අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීමයි.

(3) ඉඩම් රජයට පවරා ගැනීමයි.

(4) රජය ගම්සභා නොසලකා හැරීමයි.

(24) ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය සම්බන්ධව පහත දක්වා ඇති අදහස් යුගල අතුරෙන් නොගැළපෙන යුගලය තෝරන්න.

(1) විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීම - රත්මලානේ ධම්මාලෝක හිමි

(2) ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම - ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි

(3) නාට්‍ය මගින් මධ්‍යසාර භාවිතයේ ආදීනව පෙන්වීම - පියදාස සිරිසේන මහතා

(4) අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීම - වලිසිංහ හරිස්චන්ද්‍රතුමා

• ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ව්‍යවස්ථාදායකය හැඳින්වීමට භාවිත කරන ලද පහත දක්වා ඇති නාම ඇසුරෙන් 25 හා 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රාජ්‍ය මන්ත්‍රණ සභාව

B - ව්‍යවස්ථාදායක සභාව

C - පාර්ලිමේන්තුව

D - ද්විමණ්ඩල පාර්ලිමේන්තුව

E - ජාතික රාජ්‍ය සභාව

(25) ඩොනමෝර් හා 1972 ප්‍රතිසංස්කරණවල ව්‍යවස්ථාදායකය හැඳින්වූ නම් අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා B ය. (2) C හා D ය. (3) D හා E ය. (4) A හා E ය.

(26) කෝල්බෲක් හා සෝල්බරි ප්‍රතිසංස්කරණවල ව්‍යවස්ථාදායක හැඳින්වූ නම් අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) B සහ D ය. (2) D සහ E ය. (3) C සහ D ය. (4) A සහ B ය.

(27) පොදු අරමුණක් ජයග්‍රහණය කරවීම සඳහා සිංහල දෙමළ, මුස්ලිම් ජනවර්ග එකමුතුව පිහිටුවා ගත් සංවිධානයක් වන්නේ මින් කුමක් ද?

(1) ලංකා සංගමය (2) ලංකා ජාතික සංගමය
(3) අමද්‍යප ව්‍යාපාරය (4) සූරියමල් ව්‍යාපාරය

(28) හෙමලියා වෙස්ටර්ට්‍රික්ස් නම් දිලීර රෝගයෙන් විනාශයට පත්වූ වගාව කුමක් ද?

(1) කෝපි (2) තේ (3) රබර් (4) කොකෝවා

(29) A - පළාත් පාලන මැතිවරණය
B - පළාත් සභා මැතිවරණය
C - ජනාධිපති මැතිවරණය
D - පාර්ලිමේන්තු මැතිවරණය
E - ජනමත විචාරණය

මුළු රටම එකම ඡන්ද කොට්ඨාසයක් සේ සලකා මැතිවරණය පවත්වනු ලබන අවස්ථා දක්වෙන පිළිතුර කුමක් ද?

(1) D හා E ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා E ය.

(30) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර යටතේ ගංගාව හරස්කර බැම්මක් බඳින ලද ස්ථානය කුමක් ද?

(1) කඩදොර (2) මහියංගනය (3) බෝවතැන්න (4) පොල්ගොල්ල

(31) රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සිදු වූ වැදගත්ම සේවාව වූයේ,

(1) කටුබැද්ද විශ්ව විද්‍යාලය ආරම්භ කිරීමයි.
(2) නොමිලේ පෙළ පොත් බෙදා දීමයි.
(3) නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමයි.
(4) විද්‍යාගාර හා පුස්තකාල පහසුකම් ලබා දීමයි.

(32) පුනරුද සමයේ ගෘහ නිර්මාණවල ලක්ෂණයක් නොවන පිළිතුර කුමක් ද?

(1) පිරමිඩ හැඩයේ කුලුණු (2) වටකුරු ආරුක්කු
(3) අර්ධ ගෝලාකාර ශිඛර (4) උස් කුලුනු

- පහත වගුවේ දක්වෙන තොරතුරු අධ්‍යයනය කොට අංක 33 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නිර්මාණය | නිර්මාණකරුවා | කර්මාන්තය |
|---|---|---|
| A දුවන නඩාව | E .................................. | I රෙප්ප |
| B ......................................... | F ජේම්ස් හා ග්‍රිව්ස් | J රෙෂ |
| C රෝලර් යන්ත්‍රය | G හෙන්රි කෝට් | K ............................... |

(33) E අකුරෙන් දක්වෙන හිස්තැනට ගැලපෙන නාමය වන්නේ,
(1) හම්ප්‍රි ඩේවි (2) ජෝන් කේ ය. (3) නිව් කොමන් (4) හෙන්රි බෙස්මර්

(34) K අකුරෙන් දක්වෙන හිස්තැනට ගැලපෙන කර්මාන්තය වන්නේ,
(1) පේෂ (2) යකඩ හා වානේ (3) ගල් අඟුරු (4) මෝටර් රථ

(35) B අකුරෙන් දක්වෙන හිස්තැනට ගැලපෙන නිර්මාණය වන්නේ,
(1) මියුල් යන්ත්‍රය (2) ආරක්ෂක ලාම්පුව (3) ජෙනී යන්ත්‍රය (4) වාෂ්ප එන්ජිම

- පහත A, B, C හා D යටතේ දක්වා ඇති අදහස් යුගලයන් හි සම්බන්ධතා පරීක්ෂා කර බලා අංක 36 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. බෝල් ෂෙවික්වරු
2. ප්‍රංශ විප්ලවය

B - 1. පෞද්ගලික ඉඩම් අයිතිය
2. රුසියන් විප්ලවය

C - 1. සාරායේවෝ සිද්ධිය
2. පළමුවන ලෝක සංග්‍රාමය

D - 1. හිරෝහිතෝ අධිරාජ්‍යය
2. දෙවන ලෝක සංග්‍රාමය

(36) දෙවැන්නේ ආරම්භයට පළමුවැන්න හේතු වූ බව දක්වෙන යුගලය
(1) A (2) B (3) C (4) D

(37) පළමුවැන්න අහෝසි වීමට දෙවැන්නේ බලපෑම සිදු වූ බව පෙන්වන යුගලය
(1) A (2) B (3) C (4) D

(38) දෙවැන්න අවසන් වීමට පළමුවැන්න හේතු වූ බව පෙන්වන යුගලය
(1) A (2) B (3) C (4) D

(39) දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ වීමට බලපෑ ආසන්නම හේතුව වූයේ,
(1) ලුසිටානියා නැව ගිල්වා දැමීමයි.
(2) හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීමයි.
(3) පර්ල් වරායට ජපනුන් බෝම්බ දැමීමයි.
(4) හිට්ලර් සුඩෙන්ටන්ලන්තය ආක්‍රමණය කිරීමය.

(40) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් විසින් ගෙවිය යුතු දායක මුදල් පිළිබඳ කටයුතු කිරීම හා අය වැය අනුමත කිරීම සිදු කරනු ලබන ආයතනය කුමක් ද?
(1) ආරක්ෂක මණ්ඩලය (2) මහ ලේකම් කාර්යාලය
(3) මහා මණ්ඩලය (4) ආර්ථික හා සාමාජික මණ්ඩලය

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : ඉතිහාසය | පත්‍රය: II | කාලය: පැය 03 යි |

## II පත්‍රය

සැලකිය යුතුය.

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුර සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01)(අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

i. කලා ඔය, යාපහුව, දේවනගර, ගෝකණ්ණ තිත්ථ, හුරුලු ඔය, මැණික් ගඟ, නල්ලූර් කෝවිල, ගන්නොරුව, පාහියන්ගල, මහියංගනය, කල්පිටිය, ගම්පොල (ලකුණු 12)

ii. මධ්‍යධරණී මුහුද, ගෝව, මද්‍රාසිය, ජාවා දූපත, පර්සියන් බොක්ක, වෙනීසිය (ලකුණු 06)

(ආ) i. පහත A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ලම්බකර්ණ රාජවංශයේ ආරම්භකයා -

B - කෝට්ටේ ධර්මපාල කුමරුගේ පියා -

C - මොනාලිසා චිත්‍රයේ නිර්මාණකරුවා -

D - ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා - (ලකුණු 04)

- පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ලියා දක්වන්න.



A

ii. 1. A වලින් දක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
2. එය දක්නට ලැබෙන ප්‍රදේශය නම් කරන්න.
3. මෙහා සම්බන්ධ රජුගේ නම ලියන්න.
4. මෙය නිර්මාණයට බලපෑ සිදුවීම කුමක් ද?



B

iii. 1. B රූපයෙන් දක්වෙන පුද්ගලයාගේ නම ලියන්න.
2. මොහුගේ දේශපාලන දර්ශනය හැඳින්වූ නම කුමක් ද?
3. මෙම පුද්ගලයා අයත් වන්නේ කුමන රටට ද?
4. 1936 මොහු විසින් ආක්‍රමණය කරන ලද රට කුමක් ද?

## II කොටස

(02) i. දේශීය සාහිත්‍ය මූලාශ්‍රය වර්ගයට අයත් වන වංස කතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. ඉතිහාසය ඉගෙන ගැනීමට මූලාශ්‍රය භාවිතයේ දී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

iii. a. මෙරට භාවිතා වූ පැරණි කාසි වර්ග තුනක් නම් කරන්න.

b. ලංකාවේ කාසි නිපදවීම සිදු වී ඇත්තේ කුමන කාලයේ ද? (ලකුණු 05)

iv. ඉතිහාසය අධ්‍යයනය කිරීම සඳහා චිත්‍ර හා මූර්ති කෙතෙක් දුරට ඉවහල් වේදැයි කරුණු තුනක් ඇසුරින් උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

(03) i. සෙල්ලිපි වල සඳහන්වන පහත දක්වෙන නාම වලින් හඳුන්වා ඇති පුද්ගලයින් අනුපිළිවෙලින් නම් කරන්න.

a - වොහර b - චිතකර c - වාපර (ලකුණු 03)

ii. පහත සඳහන් විස්තරවලට සම්බන්ධ නැව්තොටුවල නම් ලියන්න.

A - ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ඒම.

B - ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ රැගෙන ඒම.

C - අනුරාධපුර රාජධානියේ ප්‍රධාන වරාය

D - පොළොන්නරු රාජධානියේ ප්‍රධාන වරාය (ලකුණු 04)

iii. පැරණි සමාජයේ සංවිධානාත්මක දේශීය වෙළෙඳාමක් පැවති බව කරුණු දෙකක් දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. දැනුම ලබා ගැනීමට මෙන්ම දැනුම ව්‍යාප්ත කිරීමට සංවිධානාත්මක ක්‍රමවේදයක් අතීතයේ මෙරට පැවති බව උදාහරණ ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 06)

(04) i. පහත දක්වෙන ඇළ මාර්ග කරවූ රජවරු නම් කරන්න.

a - ඇළ හැර b - අංගමැඩිල්ල c - මිනිපේ (ලකුණු 03)

ii. මහවැලි නිර්මාණය කිරීමෙන් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පැරණි ශිල්පීන් වැව් බැම්ම නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ තාක්ෂණික ක්‍රමවේද දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. ඉතා විශිෂ්ඨ තාක්ෂණයකින් යුත් වාස්තු විද්‍යාත්මක නිර්මාණ අතීතයේ පැවති බව උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 06)

(05) i. දෙවන නාගරීකරණය යටතේ බිහි වූ නගර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. යාපනය රාජධානිය සම්බන්ධ පහත තොරතුරු සපයන්න.

A - ආරම්භක පාලකයා

B - ඉතිහාසය පිළිබඳ තොරතුරු සඳහන් ප්‍රධාන ග්‍රන්ථය

C - රජ පරපුර හැඳින් වූ නම

D - ක්‍රි.ව. 1344 දී පැමිණි අරාබි සංචාරකයා (ලකුණු 04)

iii. කෝට්ටේ රාජධානියේ පැවති අධ්‍යාපන හා සාහිත්‍ය දියුණුව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. දෙවන පරාක්‍රමබාහු රජුගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු තුනක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) i. පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට පැවති දේශපාලන බෙදීම් සඳහන් කරන්න. (ලකුණු 03)

ii. ධර්මපාල රජුට කෝට්ටේ ජනතාවගේ සහය නොලැබීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. සීතාවක රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iv. උඩරට රජු සමඟ කටයුතු කිරීමේ දී ලන්දේසීන් අනුගමනය කළ සුවිශේෂී ප්‍රතිපත්ති තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) i. තම ආගම ප්‍රචාරය සඳහා මිෂනාරීන් යොදා ගත් මාධ්‍ය තුන ලියා දක්වන්න. (ලකුණු 03)

ii. බෞද්ධ ආගමික පුනර්ජීවනය උදෙසා පෙරමුණගත් භික්ෂූන් වහන්සේලා සිව් දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

iii. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය ක්‍රියාත්මක වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. පහත දැක්වෙන පුද්ගලයින් අතුරින් තිදෙනෙකුගේ සේවාව පිළිබඳ කරුණු දෙක බැගින් ලියා දක්වන්න.

A - අනගාරික ධර්මපාලතුමා B - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

C - අරුමුගනාවලර්තුමා D - සිද්දි ලෙබ්බෙ මහතා (ලකුණු 06)

## III කොටස

(08) i. පුනරුද සමයේ එංගලන්තයේ බිහි වූ ගත්කතුවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

ii. විද්‍යාත්මක ක්ෂේත්‍රයේ නව සොයා ගැනීම් කීපයක් පහත දැක්වේ. එම සොයා ගැනීම් සිදු කළ පුද්ගලයින් වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - ග්‍රහලෝක සූර්යා වටේ පරිභ්‍රමණය වීම.

B - රුධිර සංසරණ පද්ධතිය

C - ග්‍රහලෝක වල ඉලිප්සියාකාර ගමන් මග

D - මුද්‍රණ යන්ත්‍රය

(ගැලීලියෝ ගැලිලි, නිකලස් කොපර්නිකස්, පැරසල්සස්, විලියම් හාවේ, ජොහැන්නස් කෙප්ලර්, ගුටන්බර්ග්) (ලකුණු 04)

iii. a. නව මුහුදු මාර්ග සෙවීමට යුරෝපියන් පෙළඹීමට බලපෑ ප්‍රධාන හේතුව සඳහන් කරන්න.

b. දේශ ගවේෂණ ව්‍යාපාර සාර්ථක වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

iv. 'යුරෝපා පුනරුදයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ ද දේශපාලන හා ආර්ථික වෙනස්කම් ගණනාවක් සිදුවිය.' මෙය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) i. පහත දක්වා ඇති පුද්ගලයින් හා සම්බන්ධ දේශපාලන විප්ලවයන් අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A - ලෆායෙට් B - ලියොන් ට්‍රොට්ස්කි C - ජෝර්ජ් වොෂින්ටන් (ලකුණු 03)


ii. ඇමරිකානු විප්ලවයට තුඩුදුන් හේතු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

iii. a. සමාජවාදී දර්ශනයේ එක් මූලධර්මයක් හා


b. සමාජවාදී දර්ශනය තුළ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

iv. රුසියානු විප්ලවයට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)



## ඉතිහාසය
## පිළිතුරු පත්‍රය
## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 3 | 21. | 4 | 31. | 3 |
| 2. | 2 | 12. | 4 | 22. | 3 | 32. | 1 |
| 3. | 1 | 13. | 3 | 23. | 2 | 33. | 2 |
| 4. | 4 | 14. | 4 | 24. | 3 | 34. | 2 |
| 5. | 4 | 15. | 3 | 25. | 4 | 35. | 3 |
| 6. | 2 | 16. | 2 | 26. | 1 | 36. | 3 |
| 7. | 2 | 17. | 1 | 27. | 2 | 37. | 2 |
| 8. | 1 | 18. | 2 | 28. | 1 | 38. | 4 |
| 9. | 2 | 19. | 2 | 29. | 4 | 39. | 2 |
| 10. | 1 | 20. | 3 | 30. | 4 | 40. | 3 |

(40 X 2 = 80)

## II පත්‍රය

(01)(අ) i. ii ට අදාළ සිතියම් ලකුණු කොට ඇත.

(ආ) i. A වසභ රජු
B වීදිය බණ්ඩාර
C ලියනාඩෝ ඩාවින්චි
D ජෝර්ජ් වොෂින්ටන් (ලකුණු 04)

ii. 1. ස්මාරකයක් 2. මැද මහනුවර
3. ශ්‍රී වික්‍රම රාජසිංහ 4. රජු අත්අඩංගුවට ගැනීම. (ලකුණු 04)

iii. 1. බෙනිටෝ මුසොලිනි 2. පැසිස්ට්වාදය
3. ඉතාලිය 4. ඇබිසීනියාව (ලකුණු 04)

(02) i. මහා වංසය, දීප වංසය, ථූප වංසය, බෝධි වංසය, දාඨා වංසය (ලකුණු 03)

ii. - මූලාශ්‍රයේ කතුවරයා
- මූලාශ්‍රය රචනා වූ කාලය
- කතුවරයාගේ අරමුණු
- කරුණු සපයා ගත් ආකාරය (ලකුණු 04)

iii. a. කහපණ (පුරාණ, ධරණ) ලක්ෂ්මී කාසිය, අක කාසිය, ඇතා හා ස්වස්තික කාසිය
b. ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ අග භාගයේ හෝ ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ මුල් භාගයේ දී ය. (ලකුණු 05)

iv. - අතීත ජනතාවගේ ආගමික විශ්වාස පිළිබඳ තොරතුරු ලබා දීම.
  - ශිව නටරාජා මූර්තිය
  - ශිව පාර්වතී මූර්ති
- ඇඳුම් පැළඳුම්, ආභරණ පිළිබඳ තොරතුරු
  - සීගිරි චිත්‍ර (ලකුණු 06)
- කලා කුසලතාවයන් පිළිබඳ තොරතුරු
  - සීගිරි චිත්‍ර

(03) i. a - නීතිය පිළිබඳ දත් පුද්ගලයෝ

b - චිත්‍ර ශිල්පීන්

c - වෙළෙන්දන් (ලකුණු 03)

ii. a - දඹකොළ පටුන / ජම්බුකෝල පට්ටන

b - ලංකා පටුන / ලංකා පට්ටන

c - මාතොට / මහා තිත්ථ

d - ගෝකණ්ණ තිත්ථ (ලකුණු 04)

iii. - විවිධ වෙළඳපළවල් තිබීම.

උදා :- කාලපුමන, හෝපිටිගම, අනුරාධපුරය,

- වෙළඳ සංවිධාන පැවතීම

උදා :- පූගය, නියම ස්ථාන වැනි වචන යෙදීම.

- බදුලු ටැම්ලිපියෙන් සංවිධානාත්මක බව ඉස්මතු වීම.

- විවිධ වෙළෙන්දන් සිටීම.

උදා :- අබලවපර, වාපර (ලකුණු 05)

iv. - දූනුම පරම්පරාවෙන් උරුම වීම.

- සෙල්ලිපිවල විවිධ ගුරුවරුන් පිළිබඳ සඳහන් වීම.

උදා:- අචරිය, හති අචරිය

- විවිධ අධ්‍යාපන මධ්‍යස්ථාන තිබීම.

උදා:- මහා විහාරය, අභයගිරිය

- විවිධ භාෂාවලින් පොත් ලියවීම

උදා:- පාලි, සංස්කෘත, සිංහල

- විදේශික භික්ෂූන් පවා මෙරටට පැමිණ අධ්‍යාපන කටයුතු වලට සම්බන්ධ වීම.

උදා :- පාහියන් හිමි, බුද්ධඝෝෂ හිමි

- අධ්‍යාපනය ලැබීම හා ලබාදීම ගෞරවනීය කාර්යයක් බව පිලිගැනීම.

උදා :- ලෝකෝපකාරයේ සඳහන් තොරතුරු (ලකුණු 06)

(04) i. a. - වසභ රජු b. - I පරාක්‍රමබාහු රජු c. - අග්බෝ රජු

(ලකුණු 03)

ii. - කෘෂි කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය ජලය ලබා ගැනීම.

- ගංවතුර පාලනය කිරීම.

- නාගරික ජනතාවගේ ජල අවශ්‍යතා සපුරාලීම

- නගර සිසිලනය (ලකුණු 04)

iii. - මිටි කඳුගැට හරහා ගංගා ගලන විට කඳුගැට දෙකේ නෙරු යා කර බැම්ම බැදීම.

උදා :- බසවක්කුලම වැව, කලා වැව

- පිහිටි තද පාෂාණ ස්ථර මත වැව බැම්ම නිර්මාණය කිරීම.

- විවිධ පාෂාණ, පස් වර්ග දමා වැව් බැම්ම තැලීම.

- කෘතිම කඳු ගැට සාදා චාපාකාර බැම් බැදීම. උදා:- යෝධ වැව

iv. - චෛත්‍ය නිර්මාණය

උදා:- රුවන්වැලි සෑය පාදම

- උස් ගොඩනැගිලි නිර්මාණය

උදා :- ලෝවාමහාපාය, සත්මහල් ප්‍රාසාදය, පරාක්‍රමබාහු මාලිගය

- බලකොටු නිර්මාණය. උදා :- යාපහුව බලකොටුව

- උද්‍යාන නිර්මාණය උදා:- සීගිරි උද්‍යානය

(කරුණු තුනක් පමණ තිබීම ප්‍රමාණවත් ය.) (ලකුණු 06)

(05) i. • දඹදෙණිය • ගම්පොල
• යාපහුව • කෝට්ටේ
• කුරුණෑගල • සීතාවක
• රයිගම (ලකුණු 03)

ii. A - විජය කුලංකෙ
B - යාල්පානම් වෛපවමාලෛ
C - ආර්ය චක්‍රවර්ති
D - ඉබන් බතුතා (ලකුණු 04)

iii. - උගත් පඬිවරුන් සිටීම
උදා:- ශ්‍රී රාහුල හිමි, වීදාගම මෛත්‍රී හිමි, වැත්තෑවේ හිමි, හයවන පරාක්‍රමබාහු රජු
- උසස් අධ්‍යාපන ආයතන තිබීම.
• කැරගල පත්මාවතී පිරිවෙන
• පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන
• වීදාගම සතානන්ද පිරිවෙන
• ඉරුගල් කුලතිලක පිරිවෙන
- ග්‍රන්ථකරණය විවිධ පැතිවලට යොමු වීම.
උදා :- සංදේශ, භක්තිකාව්‍ය, හටන් කාව්‍ය, ශිලෝ කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, උපදේශ කාව්‍ය
- ග්‍රන්ථ රාශියක් ලියවීම - පැරකුම්බා සිරිත, සැලලිහිණි සංදේශය, ලෝවැඩ සඟරාව....
- විවිධ භාෂාවන්ගෙන් ග්‍රන්ථ ලියවීම. උදා:- සංස්කෘත - භක්ති ශතකය (ලකුණු 05)

iv. - කාලිංග මාඝ පරාජය කොට රජරට බේරා ගැනීම.
- චන්ද්‍රභානු ජාවකගේ ආක්‍රමණ වලට මුහුණ දී ජය ගැනීම.
- විශිෂ්ඨ සාහිත්‍යධරයෙක් නිසා කාලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත උපාධිනාමයෙන් පිදුම් ලැබීම.
- ග්‍රන්ථ රචනා කිරීම. උදා:- කව් සිළුමිණ
- ග්‍රන්ථ රචනා කිරීමට අනුග්‍රහය දැක්වීම.
- දේව පතිරාජ ඇමතිවරයා ලවා ආගමික හා ආර්ථික සේවාවන් සිදු කිරීම.
(ලකුණු 06)

(06) i. කෝට්ටේ, යාපනය, මහනුවර (ලකුණු 03)

ii. - ධර්මපාල රජු පෘතුගීසි රූකඩයක් බවට පත් කිරීම.
- ධර්මපාල රජු කතෝලික ආගම වැළඳ ගැනීම.
- කතෝලික ආගම පැතිර වීමට රජුගේ අනුග්‍රහය ලබා දීම.
- කෝට්ටේ වැසියන්ට පෘතුගීසින්ගෙන් සිදු වූ කරදර වැළැක්වීමට රජු කටයුතු නොකිරීම.
(ලකුණු 04)

iii. - රාජසිංහ රජු ශිව ආගම වැළඳ ගැනීම.
- රාජසිංහ රජුගේ බෞද්ධ විරෝධී ප්‍රතිපත්ති
- කොනප්පු බණ්ඩාර උඩරට රජවීම.
- රාජසිංහගෙන් පසු සීතාවක රාජධානියට උරුමකරුවකු නොසිටීම. (ලකුණු 05)

iv. - ගැටුම්වලින් වැළකී සාමකාමීව කටයුතු කිරීම.
- රජු සමඟ සුහදශීලී වාතාවරණයක් ගොඩනගා ගැනීම.
උදා:- තෑගි බෝග යැවීම, ලිපි හුවමාරුව, දූතයින් යැවීම.
- රජුගේ අවශ්‍යතාවලට නැව් ලබාදීම.
උදා:- උපසම්පදාව ගෙන්වීමට, බිසෝවරු ගෙන්වීමට (ලකුණු 06)

(07) i. • ලේඛනය • අධ්‍යාපනය • දේශනය (ලකුණු 03)

ii. - වලානේ සිද්ධාර්ථ හිමි
- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
- හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
- රත්මලානේ ධර්මාලෝක හිමි
- ධර්මාලංකාර සිරිසුමන තිස්ස හිමි
- පොතුවිල ඉන්ද්‍රජෝති හිමි
- වස්කඩුවේ ශ්‍රී සුභූති හිමි (ලකුණු 04)

iii. - පිරිවෙන් පිහිටුවා බෞද්ධ අධ්‍යාපනය ගිහි පැවිදි දෙපිරිසටම ලබා දී උගතුන් බිහි කිරීම.
- මුද්‍රණාල පිහිටුවා පොත්, පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම.
- වාද විවාද පැවැත්වීම.
- බෞද්ධ පාසල් පිහිටුවීම. (ලකුණු 05)

iv. A අනගාරික ධර්මපාලතුමා
- දේශන පවත්වමින් ජනතාව දැනුවත් කිරීම.
- සඟරාවලට ලිපි සැපයීම.
- විදේශීය බෞද්ධ සිද්ධස්ථාන බේරා ගැනීම
- විදේශීය බෞද්ධ ප්‍රචාර ව්‍යාපාර ආරම්භ කිරීම.
- මහා බෝධි සමාගම පිහිටුවීම

B හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
- පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම.
- බෞද්ධ පාසල් පිහිටුවීම.
- බෞද්ධ කොඩිය නිර්මාණයට දායක වීම.
- වෙසක් පොහොය දිනය නිවාඩු දිනයක් කිරීම.

C අරුමුග නාවලර්තුමා
- ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටුවීම.
- යාපනයේ ශිවන්ගල විද්‍යාලය පිහිටුවීම.
- වන්නර්පොන්නෙයිහි මුද්‍රණාලයක් ආරම්භ කිරීම.
- උදයභානු පුවත් පත ආරම්භ කිරීම.
- පොත් පරිවර්තනය කිරීම.

D සිද්දි ලෙබ්බේ මහතා
- මුස්ලිම් ජනතාව තුළ අධ්‍යාපන, ප්‍රබෝධය ඇති කිරීම.
- මුස්ලිම් නෙයිසන් පුවත්පත ආරම්භ කිරීම.
- කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම.
- මුස්ලිම් අධ්‍යාපන සංවිධානය පිහිටුවීම.
- මද්රාසා පාසල් ප්‍රතිසංවිධානය කිරීම. (ලකුණු 06)

(08) i. • තෝමස් මුවර් • විලියම් ෂෙක්ස්පියර්
• ප්‍රැන්සිස් බේකන් (ලකුණු 03)

ii. A - නිකලස් කොපර්නිකස් B - විලියම් හාවේ
C - ජොහැන්නස් කෙප්ලර් D - ජොහැන්නස් ගුටෙන්බර්ග් (ලකුණු 04)

iii. a. - 1453 කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් යටත් කර ගැනීම.

b. - මාලිමාව හා උතුරු තරු මාපකය නිපදවීම.
- ටොලමිගේ ලෝක සිතියම නිසා ලෝකය පිළිබඳ අවබෝධය ලැබීම.
- ලෝකය ගෝලාකාර බව දැන ගැනීම
- ජාතික රාජ්‍ය පාලකයන්ගේ අනුග්‍රහය (ලකුණු 05)

iv. <u>දේශපාලන</u>
- රාජාණ්ඩුව බිඳ වැටීම
- යටත් විජිතයක් වීම.
- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම ලැබීම
- රෝම ලන්දේසි නීතිය ලැබීම
- අධිකරණ පද්ධතියක් ලැබීම.

<u>ආර්ථික</u>
- ස්වයං පෝෂිත ආර්ථිකය බිඳ වැටීම.
- ආනයන අපනයන ආර්ථිකය
- වතු වගාව ආරම්භ වීම.
- වෙළෙඳ නගර, බැංකු බිහි වීම.
- ප්‍රවාහන දියුණුව

(ලකුණු 06)

(09) i. A - ප්‍රංශ විප්ලවය B - රුසියානු විප්ලවය
C - ඇමරිකානු නිදහස් සටන (ලකුණු 03)


ii. - බ්‍රිතාන්‍යයන් තම රටට වාසිදායක ප්‍රතිපත්ති අනුගමනය කිරීම.
- නව බදු වර්ග හා අණ පනත් පැනවීම.
- ජනපදවාසීන්ගේ සටන් බ්‍රිතාන්‍යයන් මර්දනය කිරීම.
- නිදහස පිළිබඳ ජනපද වැසියන් තුළ වූ උනන්දුව. (ලකුණු 04)


iii.a - සමාජයේ ධන සම්පත් පිළිබඳ පොදු අයිතිය
- තම කුසලතා ඉහළ නංවා ගැනීමට සමාන ඉඩක් ලබා දීම.
- නිෂ්පාදන ඵල සියලු දෙනාටම සමානව බෙදී යාම

b - පුද්ගල අවශ්‍යතාවලට වඩා පොදු අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දීම.
- සමාජ අසාධාරණය හා අසමානතා නැති කිරීම.
- සියලුම දෙනා සහෝදරත්වයෙන් සැලකීම. (ලකුණු 05)

iv. - රාජාණ්ඩුවේ දූෂිත භාවය
- ජනතාව පෙළමින් බදු අය කිරීම.
- ජපානය සමඟ යුද්ධයෙන් රුසියාව පරාජය වීම.
- විරෝධතාවයක් දැඩි ලෙස මර්දනය කිරීම.
- කම්කරුවන් විශාල වශයෙන් හමුදාවට බඳවා ගැනීම.
- ගොවිතැන් අඩාල වීම.
- අත්‍යවශ්‍යය භාණ්ඩ හිඟ වීම.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සංවර්ධන අංශය


නල්ලූර්කෝවිල
N
ගෝකණ්ණ තිත්ථ
හුරුළු වැව
කලා ඔය
කල්පිටිය
යාපහුව
ගන්නෝරුව
මහියංගනය
ගම්පොළ
පාහියන්ගල
මැණික් ගඟ
දේවනගර




1. (අ) (ii)
1. (ආ) (ii)
1. (ඇ) (ii)

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්වා ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
www.store.pastpapers.wiki
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

